# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2097/49 - 2018 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා - 2018.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය ෆයිසර් මුස්තාපා වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව ජල ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර, තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් එකී ජල ක්‍රීඩා සංගමයේ කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අතුරු පාලක කමිටුව පත් කරමි.

1. එස්. ආර්. ඩබ්. එම්. ආර්. පී. සත්කුමාර මයා - (සභාපති)
2. අශේන් ප්‍රනාන්දු මයා - (සාමාජික)
3. ඩබ්ලිව්. පියල් හේවගේ මයා - (සාමාජික)

තව ද, ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමයේ නිලවරණය කැඳවීම හා පැවැත්වීම සඳහා 2018 සැප්තැම්බර් මස 22 වැනි දින නිකුත් කරන ලද අංක 2089/56 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව නිලවරණ කමිටුව පත් කොට නිලවරණය පැවැත්වීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2018 නොවැම්බර් මස 16 වැනි දින සිට නිසි බලධාරියා වශයෙන් පත් කරමි.

ෆයිසර් මුස්තාපා, (ජනාධිපති නීතිඥ)
පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය,
පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය.

2018 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

11- 1398

1A - G 28974 — 12 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*